# මීරිගම ප්‍රාදේශීය සභාව
# ගම්පහ දිස්ත්‍රික්කය

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මැයි 22 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 30 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 පෙබරවාරි 26 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 **මතය**

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති මීරිගම ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

**1.3** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී මීරිගම ක්‍රීඩාංගනයේ පැතිබැම්ම ඉදිකිරීම, ඉඩම් ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනීත කර නොතිබීම නිසා ඉඩම් ගොඩනැගිලි ගිණුමේ ශේෂය රු.2,928,422 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ප්‍රාග්ධන ආධාර ගිණුම් තැබීමේදී සමාලෝචිත වර්ෂය තුළදී මුදලින් ලැබුණු රු.3,669,379 ක් පමණක් ගිණුම්වලට ඇතුළත් කර තිබුණු අතර, 2012 සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් 2013 වර්ෂයේදී ලැබුණු රු.20,636,057 ක් ගිණුමට ඇතුළත් කර නොතිබුණි. ඒ අනුව ප්‍රාග්ධන ආධාර සහ ප්‍රාග්ධන ආධාර ණයගැති ශේෂයන් එම ප්‍රමාණයෙන් අඩුවෙන් ගිණුම්වල දක්වා තිබුණි.

1.3.2 **විගණනය සඳහා සාක්ෂි නොවීම්**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.5,633,262 ක්වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>

### 2.1 <u>මූල්‍ය ප්‍රතිඵලය</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.13,041,987 ක්වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,236,516 ක් විය.

### 2.2 <u>ආදායම් පරිපාලනය</u>

#### 2.2.1 <u>ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්</u>

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

#### 2.2.2 <u>වරිපනම් බදු</u>

(අ) 2012 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු ශේෂය රු.7,170,587 ක් වූ අතර, එහි වසර 5 ඉක්මවූ රු.5,000 ට වැඩි හිඟ වරිපනම් බදු ශේෂය රු.1,256,649 ක් විය. පෞද්ගලික ආයතනයකින් රු.705,862 ක හිඟ වරිපනම් බදු ශේෂයක් පැවති අතර, එය වසර 10 ක කාලයක් පැරණි විය.

(ආ) 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ 3 වගන්තිය ප්‍රකාර ග්‍රාමසේවා වසම් 7 ක් සංවර්ධිත ප්‍රදේශ ලෙස නම්කර ඇතත් 2013 නොවැම්බර් 17 දින වන විටත් වරිපනම් බදු අයකිරීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.3 <u>බදු කුලී</u>

පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙැම්බර් 31 දිනැති අංක 80/46 දරන චක්‍රලේඛය ප්‍රකාර අවම වශයෙන් වසර 5 කට වරක්වත් කඩ කුලිය තක්සේරු කළ යුතු වුවද. 2007 වර්ෂයෙන් පසු තක්සේරු කර නොතිබුණි.

#### 2.2.4 <u>වෙනත් ආදායම්</u>

2006 සිට 2010 දක්වා කාලය තුළ ලැබූ මිශ්‍ර ආදායම් රු.89,610 ක් ආදායමට නොගෙන තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

2.2.5 **<u>උසාවි දඩ</u>**

2006 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා වූ කාලය සඳහා ලැබුණු රු.2,562,914 ක උසාවි දඩ මුදල් ආදායමට නොගෙන තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

2.3 **<u>ආර්ථික නොවූ ගනුදෙනු</u>**

**<u>තාවකාලික සතිපොළ ඉදිකිරීම</u>**

මාස 04 ක පමණ කාලයකට භාවිතා කිරීම සඳහා තාවකාලික සති පොළක් ඉදිකිරීම සඳහා පහත පරිදි ඇස්තමේන්තු දෙකක් සකස්කර තිබූ අතර, එම ඇස්තමේන්තු 2012 ජූලි 24 දින මහා සභාව විසින් පිළිගෙන තිබුණි.

| | | රු. |
|---|---|---|
| කුටි 12 ක ගොඩනැගිලි ඒකක 14 ක් සඳහා | - | 973,000 |
| කුටි 12 ක ගොඩනැගිලි ඒකක 11 ක් සඳහා | - | 764,500 |
| | | ------------ |
| | | 1,737,500 |
| | | ======= |

ඒ අනුව 2012 දෙසැම්බර් 12 දින පෞද්ගලික සමාගමක් වෙතින් ජී.අයි. බට සහ ගැල්වනයිස් තහඩු ලබාගෙන තිබූ අතර, ඒ සඳහා රු.1,737,500 ක් ගෙවීම් සිදුකර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) එකම ඉදිකිරීම සඳහා මෙසේ ඇස්තමේන්තු දෙකක් පිළියෙල කිරීමේ අවශ්‍යතාව විගණනයට පැහැදිලි නොවීය.

(ආ) මුළු එකතුව රු.1,737,500 ක් වූ මෙම වියදම සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඇ) මෙම ඉදිකිරීම සම්බන්ධයෙන් වැඩ අවසන් වාර්තාව හෝ මිනුම් වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) මාස ගණනක් වැනි සුළු කාලයක් සඳහා මෙපමණ විශාල මුදලක් වැයකර තිබූ අතර, මීට අමතරව සතිපොළ විදුලිය වියදම් ලෙස මාස 6 ක් වෙනුවෙන් රු.45,918 ක මුදලක්ද සභාව මගින් ගෙවා තිබුණි.

(ඉ) පවත්වාගෙන යන සති පොළ මෙම ස්ථානයට ගෙන ඒම සඳහා මෙම සතිපොළ ඉදිකරනු ලැබුවද 2013 නොවැම්බර් 30 වනවිටත් පොළ මෙම ස්ථානයට ගෙනවිත් නොතිබූ අතර, වෙළඳුන් බොහෝ දෙනෙක්

එහි වෙළඳාම් කටයුතුවල නිරත නොවන බව සතිපොළ භූමිය භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය. ඒ අනුව සතිපොළ ඉදිකිරීමෙන් අපේක්ෂිත ආදායම සභාවට ලැබී නොතිබුණි.

2.4 **<u>ඉඩම් අනුකොටස් බෙදීම</u>**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1998 නොවැම්බර් 13 දිනැති අංක 1053/17 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් නිවාස සංවර්ධනය හා ඉඩම් අනු කොටස් කර විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා පනවා තිබූ අතර සභාව විසින් ඒ පිළිබඳව අවධානය යොමුකර කටයුතු කර නොතිබුණි.

(i) ගැසට් නිවේදනයේ 5(4) හා 5(5) ජේද ප්‍රකාරව පිළිවෙලින් අනුබෙදුම්කරන ඉඩමේ විශාලත්වය හෙක්ටෙයාර් 0.5 හා 1 ට අඩු නම් 5%ක්ද, හෙක්ටයාර් 1 ට වැඩි 4 ට නොඅඩු නම් 8% ක ප්‍රමාණයක ප්‍රදේශයක් (පාරවල් සඳහා වෙන්කළ බිම් හැර) ප්‍රජා සේවා හා විනෝද ක්‍රීඩා කටයුතු සඳහා අදාළ අනු බෙදුම් සැලසුමෙන් වෙන් කළ යුතු වුවත්, පහත සඳහන් ඉඩම් අනු කොටස් කර විකිණීමේදි පොදු පහසුකම් සඳහා වෙන්කර නොතිබුණි.

(අ) සැලසුම් අංක 1808 හැඩිදෙනිකන්ද ගමේ පිහිටි කැදන්කැලේවත්ත ඉඩම

(ආ) සැලසුම් අංක 4430 වල්බෝතලේ උණුමුවාකැලේ නමැති ඉඩම

(ඇ) සැලසුම් අංක 2759 කල්එළිය ගමේ පිහිටි වෙල්ලවිල බොඩවත්ත

(ii) ගැසට් නිවේදනයේ 5(4), 5(5) සහ 5(6) යන ජේද ප්‍රකාරව නේවාසික කටයුතු සඳහා අනුබෙදුම් කිරීමේදි අනුමත සීමාවට වඩා අඩු ප්‍රමාණයක් ලබාගෙන තිබූ අවස්ථා සහ කිසිදු ඉඩ ප්‍රමාණයක් ලබා නොගත් අවස්ථා 7 කින් සභාවට අහිමි වී තිබූ ප්‍රමාණය පර්චස් 464.75 ක් විය.

(iii) උක්ත ගැසට් නිවේදනයේ 6(ඒ) ජේදය ප්‍රකාරව අනුබෙදුම් කිරීමට යෝජිත ඉඩමට නල ජල පහසුකම් නොමැති නම් පානීය ජලය ලබාගත හැකි බවට ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ ලිඛිත නිර්දේශයද 6(ඔ) ජේදය ප්‍රකාරව නේවාසික කටයුතු සඳහා සුදුසු බවට ප්‍රදේශය භාර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ ලිඛිත නිර්දේශයද 6(ඕ) ජේදය ප්‍රකාරව ඉඩමට විදුලිය සපයන බවට ලංකා විදුලිබල මණ්ඩලයෙන් සහතිකයක්ද ලබාගත යුතු වුවත් එවැනි සහතික කිරීම් වලින් තොරව ඉඩම් අනුකොටස්වලට බෙදීම අනුමත කර තිබුණි.

---

(iv) උක්ත ගැසට් නිවේදනයෙ 11(ඇ) ජේදය ප්‍රකාරව අනුබෙදුම්කරන ඉඩමේ ඇතුළත වෙන්කරන සියළුම මාර්ග ඉඩම් කැබලි 20 සිට ඉහළ අගයක් ගනී නම් පාරේ පළල මීටර් 9 ක් (දළ වශයෙන් අඩි 30 ක්) වියයුතු බව දැක්වෙතත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) සැලසුම් අංක 1401 ලෝලුවාගොඩ කැමිලස්වත්ත අක්කර 43 යි රූඩ් 1 ක පොල් ඉඩම වෙන්දේසි කිරීමේ සැලසුම 2005 වර්ෂයේදී අනුමත කර තිබූ අතර පහත කරුණු අනාවරණය විය.

(i) උක්ත පළමු ජේදයේ සඳහන් ගැසට් නිවේදනයේ 6(ඇ) ජේදය ප්‍රකාරව අනු බෙදුම් කිරීමට යෝජිත ඉඩම හෙක්ටයාර් 0.4 ට වැඩි පොල් ඉඩමක් නම් ඒ සඳහා පොල් වගා කිරීමේ මණ්ඩලයේ අනුමැතිය ගතයුතු බව දැක්වෙතත් 2004 අගෝස්තු 10 දිනැති අංක සීඕඑස්/කට්ටි/2004 දරන පොල් වගා කිරීමේ මණ්ඩලයේ සභාපතිගේ ලිපිය අනුව මේ සඳහා අනුමැතිය ලබා දී නොතිබුණි.

(ii) ඉඩම කොටස් කිරීමෙන් පරිසරයට හානියක් නොමැති බවට මධ්‍යම පරිසර අධිකාරියෙන් නර්දේශයක් ලබාගතයුතු වුවත්, 2004 ඔක්තෝබර් 04 දිනැති අංක 08/NRM/LAND/117/2004 දරන මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂවරයාගේ ලිපිය මගින් මේ සඳහා අනුමැතිය ලබාදී නොතිබුණි.

(iii) උක්ත ගැසට් නිවේදනයේ 5(7) ජේදය ප්‍රකාරව ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා අනුමත කරනු ලබන ස්ථානයක් සුසාන භූමියක් සඳහා වෙන්කළ යුතු අතර එම ප්‍රමාණය හෙක්ටයාර් 10 ට වැඩි වන්නේ නම් සුසාන භූමියේ ප්‍රමාණය ගැසට් නිවේදනයේ 5(7) (ආ) නියමයන්ට අනුකූල වනසේ සභාව විසින් තීරණය කළයුතු බව දැක්වෙතත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(iv) උක්ත ගැසට් නිවේදනයේ 5(8) ජේදය ප්‍රකාරව කැලි කසල සඳහා ප්‍රමාණවත් භූමියක් සභාවේ එකඟතාවය ඇතිව වෙන්කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(v) ප්‍රජා සහ විනෝද කටයුතු සඳහා පාරවල් අත්හැරීමෙන් පසු 10% ක ප්‍රමාණයක් එනම් පර්චස් 586.07 සභාවට පවරා දියයුතු වුවත්, අදාළ ඔප්පුව අනුව පර්චස් 358.5 ක ප්‍රමාණයක් පවරා දී තිබූ අතර පර්චස් 343.5 ක ප්‍රදේශයක් පොදු පහසුකම් සඳහා යොදා ගැනීමට සුදුසු ප්‍රදේශයක් නොවිය.

2.5 **<u>ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි</u>**

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) ආයතනය විසින් හිඟ වරිපනම් හා ටෙන්ඩර් මුදල් එකතුව රු.797,358 ක් අයකර ගැනීම සම්බන්ධයෙන් නඩු දෙකක් පවරා තිබූ අතර, බාහිර පාර්ශව විසින් සභාවට එරෙහිව නඩු 5 ක් පවරා තිබුණි. මෙම නඩු වලින් 4 ක් ඒ ඒ පාර්ශවයන්ට සිදු වී ඇති අසාධාරණයන් පිළිබඳව වූ අතර එක් නඩුවක් පරිසර දූෂණය වනසේ වෙළඳ ව්‍යාපාර පවත්වාගෙන යාමට අවසර දීම පිළිබඳව රු. ලක්ෂ 10 ක වන්දියක් ඉල්ලා පවරන ලද නඩුවක් විය. සමාලෝචිත වර්ෂය තුළදී සභාව විසින් උක්ත නඩු සම්බන්ධයෙන් රු.76,000 ක නීතිඥ ගාස්තුවක් වැයකර තිබුණි.

(ආ) 2002 වර්ෂයේදී පනාවල මාර්ගය පුළුල් කිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේදී, ඉඩම් අත්පත් කර ගැනීමේ ආඥා පනතේ සඳහන් පරිදි ක්‍රියාකර නොතිබීම නිසා පීඩාවට පත් තැනැත්තෙකු විසින් රු.35,000 ක අලාභයක් ඉල්ලා 2003 වර්ෂයේදී සභාවට විරුද්ධව නඩු පවරා තිබූ අතර 2008 වර්ෂයේදී අලාභය සහා අරමුදලින් ගෙවීමට සිදුවී තිබුණි. නමුත්, එම මුදල අදාළ පාර්ශවය වෙත සභාව විසින් නොගෙවීම නිසා දඩ මුදල් සමඟ ගෙවියයුතු මුළු මුදල රු.94,918 ක් වී තිබුණි. මෙම මුදල ද නොගෙවීම නිසා 2012 දෙසැම්බර් 18 දින සභාවට අයත් ත්‍රීරෝද රථය අධිකරණය විසින් තහනමට ගෙන තිබූ අතර 2013 ජනවාරි 04 දින රු.94,918 ක් අත්තනගල්ල දිසා අධිකරණය වෙත ගෙවා ත්‍රීරෝද රථය නිදහස්කරගෙන තිබුණි. අධිකරණ නියෝගය අනුව නියමිත දිනට අදාළ ගෙවීම් කිරීමට වගකිවයුතු නිලධාරීන් ක්‍රියාත්මක නොවීම නිසා වැඩිපුර මුදල් ගෙවීමට සිදුවී ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

2.6 **<u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>**

පහත කරුනු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) ප්‍රාග්ධන ආධාර ණයගැති (2.81) ගිණුමේ ආරම්භක ශේෂය වු රු.1,979,294 ක මුදල වසර පුරා නොවෙනස්ව පැවති අතර, එම මුදල අදාළ පාර්ශව වෙතින් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, (3-81) ප්‍රාග්ධන ආධාර ණයගැති ගිණුමේ ආරම්භක ශේෂය වු රු.5,233,330 ක මුදලින් සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රතිපූර්ණය වී තිබුණේ රු.2,754,525 ක් පමණි. ඉතිරි ශේෂය වු රු.2,478,805 ක මුදල ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2012 දෙසැම්බර් 31 දිනට කරන ලද භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව අයිතම් 20 ක් සම්බන්ධයෙන් භාණ්ඩ 93 ක ඌනතාවයක් පැවති අතර මෙම ඌනතා සම්බන්ධව ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) සභාවට අයත් කඩ කාමර 32 ක ගිවිසුම් 2009, 2010,2011 වර්ෂවලදී අවසන්ව ඇතත්, එම කඩ කාමර සම්බන්ධයෙන් ගිවිසුම් අළුත් කිරීම නැවත ටෙන්ඩර් කිරීම හෝ කර නොතිබුණි.

## 2.7 අවිධිමත් ගනුදෙනු

සභාවට ත රෝද රථ 4 ක් මිලදී ගැනීම සඳහා, 2012 වාර්ෂික අයවැය ලේඛනය මගින් රු.1,600,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබූ අතර, ඒ අනුව 2012 මැයි 18 වෙනි දින පෞද්ගලික ආයතනයකින් එකක් රු.525,000 බැගින් වූ මිලකට ත්‍රීරෝද 04 ක් මිලදී ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) මිල කැඳවීම් ලිපියේ අවශ්‍ය පිරිවිතර දක්වා නොතිබුණි.

(ii) ඉදිරිපත් කළ මිල ගණන් අනුව අවම මිල රු.510,020 ක් වූ අතර, තෝරාගත් මිල රු.525,000 ක් විය. මේ සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව හෝ මුදල් කමිටු නිර්දේශ විගණනයට ඉදිරිපත් නොවීය.

(iii) උක්ත මිලදී ගැනීම සම්බන්ධයෙන් ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ සහ පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

## 3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අභ්‍යන්තර විගණනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) ගබඩා පාලනය
(ඉ) ඉඩම් අනුකොටස් බෙදීම